සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

(i) පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

(ii) පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

(01) සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

(1) සොකරි රඟ මඩල .......................... නමින් හඳුන්වයි.

(2) .......................... කවි ගද්‍ය හා පද්‍ය කොටස්වලින් යුක්ත ගායනා විශේෂයකි.

(3) වේදිකා සැරසිලි, ආලෝකකරණය .......................... අභිනයට අයත් වේ.

(4) විලම්භ, මාධ්‍ය, .......................... වශයෙන් ලය කොටස් තුනකි.

(5) පරාක්‍රමබාහු රජු විසින් සෙබළුන්ගේ ආශ්වාදය පිණිස නැටුම් ගැයුම් වැයුම් පැවැත් වූ බව .......................... සඳහන් වේ.

(6) .......................... නර්තන සම්ප්‍රදායේ විචිත්‍රවත් ඇඳුම් පැළඳුම් දක්නට ලැබේ.

(7) ''සොබමන් දෙවිවරු සිදනෙක් එතනට...'' මෙය .......................... කවියකි.

(8) ''උඩරට නර්තන කලාව'' ග්‍රන්ථය රචනා කරන ලද්දේ .......................... මහතා ය.

(9) උඩරට වන්නම් මහනුවර .......................... මඩුවේ දී හා පහතරට සින්දු වන්නම් දෙවින්දර .......................... දේවාලයේ දී රචනා කල බව සඳහන් වේ.

(10) කථකලි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ගායකයා .......................... නමින් ද අනු ගායකයා .......................... නමින් ද හඳුන්වයි. (ලකුණු 1 × 12)

(02) (1) මාත්‍රා 2 + 4 දෙතිතට අයත් බෙර පදයක් / දවුල් පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 02)

(2) මාත්‍රා 04 තනි තිතට අයත් වන්නමක / සිංදු වන්නමක කවි පද දෙකක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(3) මාත්‍රා 2 + 4 දෙතිතට අයත් අඩව්වක් / ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

(03) (1) ඔබ ඉගෙනගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණු 02ක් ලියන්න. (ලකුණු 02)

(2) එම ශාන්ති කර්මයෙහි යොදා ගන්නා රංග භාණ්ඩ හා සැරසිලි පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 04)

(3) කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව යන ශාන්ති කර්මයන්හි දක්නට ලැබෙන නර්තන අංග 02 බැගින් ලියන්න. (ලකුණු 06)

Department of Education - Western Province

(04) පහත සඳහන් මාතෘකා ඇසුරින් 03ක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.

(1) අංග රචනය (2) වන්නම්

(3) ත්‍රිවිධ ලය (4) ගැමි නැටුම් (5) සතර අභිනය

(ලකුණු 04 x 3)

(05) (1) මුද්‍රා නාට්‍ය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(2) මුද්‍රා නාට්‍යයක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 02ක් ලියන්න. (ලකුණු 04)

(3) ඔබ උගත් මුද්‍රා නාට්‍යයක් නම් කර එයට පසුබිම් වූ කථා පුවත කෙටියෙන් ලියන්න.

(ලකුණු 06)

(06) (1) සොකරි ගැමි නාටකය පැවැත්වීමේ අරමුණු 02ක් ලියන්න. (ලකුණු 02)

(2) සොකරි නාටකයේ එක් චරිතයක් හඳුන්වාදීමේ කවියක් ලියන්න. (ලකුණු 04)

(3) මෙම නාටකයේ ගායන, වාදන, රංග වස්ත්‍රාභරණ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

(07) (1) ළමයාගේ මානසික ස්වස්ථතාව කෙරෙහි බලපාන පාරිසරික සාධක 02ක් ලියන්න.

(ලකුණු 02)

(2) නර්තන විෂය හදාරණ සිසුන් මානසික ස්වස්ථතාව පවත්වා ගැනීමෙන් ඔවුන් තුළ ඇති වන කුසලතා 02ක් ලියන්න. (ලකුණු 04)

(3) නර්තන ක්‍රියාකාරීත්වය තුළින් වර්ධනය වන හැකියා පිළිබඳව විස්තරයක් කරන්න.

(ලකුණු 06)

Department of Education – Western Province